2019 අප්‍රේල් 21 – 2026 අප්‍රේල් 21

# මතකය, වේදනාව සහ බලාපොරොත්තුව

### වසර 07කට පසුත් යුක්තිය සොයා !

## විධායක සාරාංශය


### හැඳින්වීම

පාස්කු ඉරිදා දිනයක් වූ 2019 අප්‍රේල් 21 වැනිදා ශ්‍රී ලංකාවේ සිදුවූ ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරයෙන් වසර හතක් ගතවන මොහොතේ, සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR) මගින් විශේෂ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රධානතම අරමුණ මතකය අවධිකිරීමත්, වේදනාව බෙදාහදා ගැනීමත් මෙන්ම ඉන් ඔබ්බට ගොස් යුක්තියේ බලාපොරොත්තුව ළඟා කර ගැනීම සඳහා සත්‍යය දැනගැනීම සහ අපරාධ යුක්තිය ඉටුකර ගැනීමට යම් බලපෑමක් කිරීමය. ප්‍රහාරයෙන් වසර හතකට පසු විමර්ශන යම් සාධනීය දිශානතියකට යොමු වෙමින් පවතින බව පෙනී යන අතර, මෙම වාර්තාව මගින් මෙතෙක් සිදු වූ විමර්ශන අටක (08) ක්‍රියාවලිය විමර්ශනාත්මකව විශ්ලේෂණය කරයි.

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන සොයා බැලීමේ අරමුණ මෙන්ම ඒ හා සමගාමීව මතුවන චෝදනා යටපත් කිරීමේ දේශපාලන අරමුණද සහිතව ගෙවුණු වසර හත තුළ කමිටු, කොමිෂන් සභා සහ විමර්ශන අංශ විසින් සොයා බැලීම් කිහිපයක් සිදු කර තිබේ.

- විනිසුරු විජිත් මලල්ගොඩ කමිටුව: ප්‍රහාරයෙන් පැය 24ක් ඇතුළත පත් කෙරුණු මෙය, බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට අපොහොසත් වීම පිළිබඳ මූලික කරුණු අනාවරණය කළේය.
- ජනක් ද සිල්වා ජනාධිපති පරීක්ෂණ කොමිසම: වඩාත් දීර්ඝ විමර්ශනයක් කළ මෙම කොමිසම, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඇතුළු පිරිසකට එරෙහිව අපරාධ නඩු පැවරීමටත්, ඇතැම් සංවිධාන තහනම් කිරීමේ සිට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දක්වා වූ නිර්දේශ ගණනාවක් සිදු කළේය.
- පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව: මෙහිදී ආරක්ෂක අංශවල සම්බන්ධීකරණයේ බරපතල අඩුවක් සහ බුද්ධි අංශ විසින් සහරාන් පිළිබඳව දැනුවත්ව සිටි බව අනාවරණය විය. එසේම පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හුදකලා සිදුවීමක් නොව බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්ද යන්න ගැන සැක ඇතිකරවන ආකාරයේ නිරීක්ෂණ ද ඇතුළත් විය.
- විනිසුරු එස්. අයි. ඉමාම් : බ්‍රිතාන්‍යයේ චැනල් ෆෝ (Channel 4) නාලිකාවේ හෙළිදරව්ව සම්බන්ධයෙන් පත් කළ මෙම කමිටුව, චෝදනා ලැබූවන්ගෙන්ම සාක්ෂි

විමසා ඔවුන් එම චෝදනාවලින් නිදහස් කිරීමට උත්සාහ කළ බවට බැලූ බැල්මට නිරීක්ෂණය වේ.

- විනිසුරු ජයකි ද අල්විස් කමටුව : පාස්කු ප්‍රහාරයේ මූලික විමර්ශනවල අධීක්ෂණ නිලධාරීන් වූ රවී සෙනවිරත්න සහ ශානි අබේසේකර ජාතික ජන බලවේගයේ විශ්‍රාමික පොලිස් සාමූහිකයේ වැඩසටහනට සම්බන්ධවීමෙන් දින කිහිපයකට පත් කෙරුණු කමිටුවක් වන අතර පෙර වාර්තාවලට එහා ගොස් ශානි අබේසේකර සහ රවී සෙනවිරත්න ප්‍රහාරයට වගකිව යුතු බවට නිරීක්ෂණ ලබාදී තිබේ.
- 2019 අප්‍රේල් සිට 2019 නොවැම්බර් දක්වා වූ අපරාධ විමර්ශනය : මෙම විමර්ශනවලදී ප්‍රහාරකයන් හා සම්බන්ධ සැලකිය යුතු පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගත් අතර ඔවුන්ගෙන් බහුතරයකට මේ වන විටත් අපරාධ නඩු ගොනු කර තිබේ. සහරාන් මෙහෙයවූයේ කුමන පාර්ශ්වද යන්න ගැන විමර්ශනය කරමින් සිටියදී ජනාධිපතිවරණයත් සමග විමර්ශන අතරමග නතර විය.
- 2019 නොවැම්බර් සිට 2024 ඔක්තෝබර් දක්වා : දේශපාලන වුවමනා මත යම් යම් පාර්ශ්ව පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හා සම්බන්ධ කිරීමට උත්සාහ ගැනීම් මෙන්ම ප්‍රහාරය පිළිබඳ සත්‍ය යටපත් කිරීමට උත්සාහ කිරීම ගැන ද මෙම කාල වකවානුවේ කළ විමර්ශන සම්බන්ධයෙන් චෝදනා එල්ල විය. විමර්ශනයේ මුල් වසර දෙකේදී පමණක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරු 05කට වැඩි පිරිසක් ස්ථාන මාරු කෙරිණි.
- 2024 ඔක්තෝබර් සිට මේ දක්වා : යුක්තිය පිළිබඳ යම් බලාපොරොත්තුවක් ඇති වන ආකාරයට විමර්ශන ආරම්භ වී තිබේ. මූලික වශයෙන් චැනල් ෆෝ නාලිකාවේ අනාවරණය ගැන විමර්ශන සිදු කෙරෙයි.

සත්‍ය අනාවරණය කර ගැනීම සඳහා පත් කළ බවට අපට නිරීක්ෂණය කළ හැකි සියලු කමිටු සහ කොමිෂන්වල වාර්තා මගින් ඉඟි කරන්නේ මෙම ප්‍රහාරය සහරාන් හෂීම් ඇතුළු කල්ලියකගේ ක්‍රියාවක් පමණක් නොව, ඊට එහා ගිය සංවිධානාත්මක කුමන්ත්‍රණයක ලක්ෂණ ඇති බවයි.

1. බුද්ධි අංශවල අසමත්කම සහ නොමග යැවීම: රාජ්‍ය බුද්ධි සේවය (SIS) සහ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය (DMI) සතුව ප්‍රහාරයට පෙර තොරතුරු තිබී ඇතත්, ඒවා නිසි ලෙස හුවමාරු වී නැත. විශේෂයෙන්ම සහරාන් ලංකාවේ සිටියදී ඔහු ඉන්දියාවට ගොස් ඇති බවට හමුදා බුද්ධි අංශ වැරදි මතයක් දරා සිටීම බරපතල සැකයට තුඩු දෙන්නකි.
2. චැනල් ෆෝ හෙළිදරව්ව, සුරේෂ් සලේ සහ බුද්ධි අංශ : හන්සීර් අසාත් මවුලානා විසින් කරන ලද හෙළිදරව්ව අනුව, රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ සුරේෂ් සලේ සහ පිල්ලෙයාන් මෙම ප්‍රහාරය සඳහා ආධාර අනුබල දුන් බවට චෝදනා එල්ල වී ඇත. මලල්ගොඩ කමිටුවේදී හෙළිවූයේ ත්‍රස්ත මර්දන කොට්ඨාසය සහරාන් සම්බන්ධ සම්පූර්ණ ලිපිගොනු නීතිපති දෙපාර්තමේන්තුවට යවා නොමැති බවයි.

ජනාධිපති කොමිසමේදී සහ විශේෂ කාරක සභාවේදී හෙළිදරව් වූයේ යුද හමුදා බුද්ධි අංශ මෙම ඇතැම් බෝම්බකරුවන් ගැන සමීපව අධීක්ෂණය කළ බවයි. එසේම ඔවුන්ගේ කණ්ඩායම්වල ඉහළ පෙලේ ඇතැම් සාමාජිකයන් ආරක්ෂක අංශ සිය ඔත්තුකරුවන් ලෙස ද සම්බන්ධ කරගෙන සිට ඇති බවයි. එසේම චැනල් ෆෝ හරහා දේශපාලන කුමන්ත්‍රණයක් ගැන හෙළිදරව් කළ හංසීර් අසාත් මවුලානා හා සහරාන්ලා අතර සබඳතා තිබූ බව විනිසුරු ඉමාම් කමිටුවට පිළිගැනීමට සිදුවීම ද විශේෂත්වයකි.

### අධිකරණ ක්‍රියාවලිය සහ වර්තමාන තත්ත්වය

නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පාස්කු ඉරිදා සිදුවූ ප්‍රහාරයට අදාළව මහාධිකරණවල නඩු 41ක් ගොනු කර ඇත. ඉන් වඩාත් වැදගත් නඩුවක් වන්නේ චූදිතයන් 25 දෙනෙකුට එරෙහිව කොළඹ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ විභාග වන නඩුවයි. එය දිනපතා විභාගවන නඩුක් වන අතර එක් චූදිතයකු මරණයට පත්වී ඇති හෙයින් චූදිතයන් 24 දෙනකුට එරෙහිව නඩුව විභාග වෙයි.

2024 ඔක්තෝබර් මාසයෙන් පසු විමර්ශනවල යම් ප්‍රගතියක් දක්නට ලැබෙන අතර, ඒ අනුව සුරේෂ් සලේ ඇතුළු සැකකරුවන් තිදෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන ඇත. කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ඔවුනට එරෙහිව කරුණු වාර්තා කර තිබෙන අතර අදාල නඩුවේ සැකකරුවන් ලෙස සුරේෂ් සලේ ඇතුළු තිදෙනකු නම් කර තිබේ. මෙය යුක්තිය ඉටුවීම කෙරෙහි යම් බලාපොරොත්තුවක් ඇති කරවන්නකි.

### තවදුරටත් විමර්ශනය කළ යුතු කරුණු

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීමට නම් පහත කරුණු පිළිබඳව ගැඹුරු විමර්ශනයක් අවශ්‍ය බව සමාජය හා සාමයික කේන්ද්‍රය අවධාරණය කරයි:

- අබ්දුල් ලතීෆ් ජමීල්: ටාජ් සමුද්‍රා හෝටලයේ බෝම්බය පුපුරුවා නොගත් ජමීල්ගේ දුරකථන ඇමතුම් සහ ඔහු පරීක්ෂා කිරීමට ගිය බුද්ධි නිලධාරීන්ගේ හැසිරීම, ජමීල්ගේ දුරකතනය අතුරුදන්වීම සහ මවුලානාගේ චෝදනාව.
- අබු හින්ද්: සහරාන්ව මෙහෙයවූ බව කියන මෙම රහසිගත චරිතයේ සැබෑ අනන්‍යතාවය සහ ඔහු පිටුපස සිටින බලවේගය හඳුනාගැනීම.
- සාරා ජස්මින්: සයින්දමරුදු ප්‍රහාරයෙන් සාරා ජස්මින් පලා ගියේද යන්න සහ ඇගේ ඩී.එන්.ඒ (DNA) පරීක්ෂණවල පවතින අභිරහස් තත්ත්වයත්, සහරාන් කල්ලිය තුල ඇගේ භූමිකාව සහ ඇයට රැකවරණය දුන් තැනැත්තන් හඳුනා ගැනීම.
- වනාතවිල්ලුව සහ බුද්ධි අංශ ඒජන්තයන්: බෝම්බකරුවන්ගේ කණ්ඩායම තුළ යුද හමුදා බුද්ධි අංශ ඔත්තුකරුවන් සිටියදීත් ප්‍රහාරය වැළැක්වීමට නොහැකි වීම.
- රාජ්‍ය බුද්ධිසේවය සහ යුද හමුදා බුද්ධි අංශ මතගැටුම - සහරාන් සම්බන්ධයෙන් මෙම බුද්ධි අංශ දෙක මත දෙකක සිටි බවට අනාවරණය වී ඇති අතර ඊට හේතුවූ කාරණා හඳුනාගැනීම.

**නිගමනය සහ ඉල්ලීම්**

සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය වන්නේ පාස්කු ප්‍රහාරය පිටුපස සිටින "මහ මොළකරුවන්" සහ 'සැලසුම්කරුවන්' අනාවරණය කර ගැනීම සඳහා තවදුරටත් විමර්ශන සිදුවිය යුතු බවයි. එබැවින්:

1. මෙතෙක් කළ සියලුම විමර්ශන වාර්තා සහ සාක්ෂි සටහන් මහජනතාවට ප්‍රසිද්ධ කළ යුතුය.

2. මෙතෙක් මේ ගැන සොයා බැලූ කමිටු, කොමිෂන් සභා සහ විමර්ශනවල සාක්කි සහ සොයාගැනීම් ගැන අධ්‍යයනය කර වැඩිදුර විමර්ශන සඳහා උපදෙස් දීමටත්, අදාල කටයුතු සිදු කිරීමටත් දෙස් විදෙස් විශේෂඥයන්ගෙන් සමන්විත පූර්ණ බලැති මිශ්‍ර කොමිෂන් සභාවක් පත් කළ යුතුය.

3. විමර්ශනවලට බාධා කළ, සාක්ෂි විනාශ කළ සහ විමර්ශන නොමග යැවූ සියලු දෙනාට එරෙහිව විනය හා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

4. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන වර්තමානයේ ආරම්භ වී ඇති විමර්ශන කඩිනම් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ විමර්ශකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම කළ යුතු අතර විමර්ශන සාධාරණව සිදු කිරීමට අවශ්‍ය වටපිටාව සැකසීම සඳහා ආන්දෝලනාත්මක සයින්දමරුදූ සිදුවීම වන අවස්ථාවේ නැගෙනහිර ආඥාපතිව සිටි වත්මන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය අරුණ ජයසේකර මහතා විමර්ශන අවසන් වන තෙක් අදාල තනතුරින් ඉවත් කළ/ඉවත් විය යුතුය.

5. සමාජය හා සාමයික කේන්ද්‍රය 2025 අප්‍රේල් 17 වැනිදා ප්‍රසිද්ධියට පත් කළ තවදුරටත් විමර්ශනය කළ යුතු ප්‍රධාන කරුණු 05න් චැනල් ෆෝ සිදුවීම ගැන විමර්ශන මේ වන විටත් ආරම්භ වී ඇති අතර සෙසු කරුණු 04 ගැන කඩිනමින් විමර්ශන ආරම්භ කළ යුතුය.

6. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාල සියලු සාක්කිකරුවන්ගේ ආරක්ෂාව සහතික කළ යුතුය.

7. සමාජය හා සාමයික කේන්ද්‍රය 2025 වසරේ දී ප්‍රසිද්ධියට පත් කළ වින්දිතයන්ට වූ ආර්ථික සහ සමාජයීය බලපෑම ගැන වාර්තාව ද සැලකිල්ලට ගෙන වින්දිතයන්ගේ හානි පූර්ණ ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය.

වසර හතක අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස දැන් ඇති වී තිබෙන බලාපොරොත්තුව, යුක්තිය ඉටුවන තෙක් ඉදිරියට ගෙන යාමට සියලු දෙනා එක්විය යුතුය.

**පර්යේෂණ කණ්ඩායම**
**සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR).**
2026 අප්‍රේල් 17 වැනිදා